301

චක්‍රලේඛ අංකය: 03/2009

29 MAY 2009

ප්‍ර.නො.10/30/52/පොදු /09
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
2009.05.

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් වෙත.

<u>නොතාරිස් ඔප්පු කෙටුම්පත් පිළිබඳව කටයුතු කිරීම හා ඔප්පුවල වටිනාකම අඩුවෙන් සඳහන්කර ඇතිබව දැනගත්විට ඒ පිළිබඳව කටයුතු කිරීම.</u>

ඔප්පු කෙටුම්පත් විනාශකිරීම යන කාරණය යටතේ මා විසින් සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන්ට 2003.10.17 වෙනි දින යවන ලද මාගේ චක්‍රලේඛ අංක 13/2003 දරණ ලිපියට ඔබගේ කරුණික අවධානය යොමුකරවනු කැමැත්තෙමි.

02. නොතාරිස් ඔප්පු කෙටුම්පත් විනාශ කරනු ලබන ආකාරය පිළිබඳව පැහැදිලි උපදෙස් මෙම චක්‍රලේඛ ලිපියෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන්ට ලබාදී ඇතත් මෙම කාර්යය නිසි පරිදි ඉටුනොවන බව පෙනෙන්නට තිබේ.සමහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල වල මියගිය නොතාරිස් වරුන්ගේ ඔප්පු කෙටුම්පත් අවුරුදු ගණනාවක් ගබඩාකර තබාගැනීම නිසා කාර්යාලයේ ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවී ඇති අතර මේ කාරණය හේතුවෙන් කාර්යාලයේ පවිත්‍රතාවයටද බාධා සිදුවන බව පෙන්වාදෙනු කැමැත්තෙමි. එබැවින් විනාශ කළ යුතු ඔප්පු කෙටුම්පත් ආදිය ක්‍රමවත් සැළැස්මක් යටතේ විනාශකර දැමීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි. ඔබගේ පහසුව සඳහා අංක 13/2003 හා 2003.10.17 වෙනි දින දරණ චක්‍රලේඛයද, දෙ.නි. 602, 603, 604, 605, හා 607, දරණ රෙගුලාසි ඇතුළත් සටහනක්ද මෙසමඟ ඔබවෙත එවමි.

03. එසේම ලියාපදිංචි කිරීම සඳහා ඔබවෙත භාරදෙනු ලබන ඔප්පුවල සඳහන් උපලේඛනගත ඉඩම්වල වෙළඳපොල වටිනාකම අඩුවෙන් සඳහන්කර ඇති බවට දැනගැනීමට ලැබුණු අවස්ථාවල ඇතැම් ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් කටයුතු කරන ආකාරයද එතරම් යහපත් නොවේ. මෙවැනි අවස්ථාවක ඔප්පුවේ මුල් පිටපත සමාන්‍ය <u>පරිදි ලියාපදිංචි කරයවා ඔප්පු දෙවෙනි පිටපත ඔබ වෙත තිබේනම් ඒ මත හෝ මුල්</u> ඔප්පුවෙන් ලබාගත් සහතික කරනලද පිටපතක් මත තක්සේරු දෙපාර්තමේන්තුවෙන් හෝ ප්‍රාදේශිය ලේකම් වරයාගෙන් වටිනාකම් වාර්තාවක් ලබාගෙන හිඟ සහ දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ හැකිවේ. මෙසේ හිඟ සහ දඩමුදල් නොගෙවන අවස්ථාවලදී ඒ පිළිබඳව විකුණුම් ඔප්පු තෑගි ඔප්පු හා හුවමාරු ඔප්පු නම් පළාත් අදායම් කොමසාරිස් වරයා වෙතද අනෙකුත් ඔප්පු සම්බන්ධව නම් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙතද වාර්තා කරන්න.

ටී.එම්.ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. ලේකම්, රාජ්‍යපාරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය.
2. ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යම ලේඛණාගාරයේ සියලුම මාණ්ඩලික නිලධාරින්
3. සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් වෙත.
4. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් අභ්‍යන්තර විගණන අංශය

} ඔබගේ දැනගැනීම සඳහා